# රට වැඩුමට තරුණ සවිය

පෝර රස වැදි නිල්ල ගසමින් අහස උසට වැඩී පල දරණ පොල් අක්කර දෙසීයයි. ඒ අතරින් පතර කැත් බරින් බිමට නමා වැටෙන කෝලිකුට්ටු, ඇඹුල්, ආනමාලු, කෙසෙල් ගස්. තවත් තැනක මයියොක්කා, කිරි අල, කුකුලල; අල හාරන්න හොඳටම ආසන්නයි. එක පැත්තක දවසකට කිරි පයින්ට් 130 ක් විතර ලබා ගන්න කිරි දෙනුන් දොලොස් දෙනෙකුත්, ගවයන් 29 කුත් ඉන්න කිරි පට්ටිය. තවත් පැත්තක පැසී නැමී සුළඟේ සෙලවෙන කරලින් බර අක්කර 8 ක කුඹුරු යායක්. එක තැනක ලොකු කුකුල් කොටු වක් – තව තැනක ඌරු ගාලක්.

මේ වගේ කලබලකාරී පරිසරයක වඩු මඩුවක් ඇතුලෙ තරුණයෝ දෙන්නෙක් වානෙ පට් රත් කර තලා කැති, මන්න, පිහි, බාල්දි හදනව. තරුණයෝ දෙන්නෙක් වත් තෙම තියන අක්කර 60 ක් විතර ඇති තණ බිමෙන් කරත්තයක් පුරා තණකොළමිටි ගෙනල්ල ගව ගාලට දානව.

තව තරුණ තරුණියන් පිරිසක් කොප්පරා මඩුව ළඟ බරටම වැඩ.

පොල්ගහවෙල – කැගල්ල පාරේ සෙරපිස් සාමූහික ජනාවාසයේ සතියේ වැඩ කරන දිනයක ඔය විදිහෙ ලොකු කලබලකාරී ගතියක් දකින්නට ලැබුන.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමෙන් ලැබුණ අක්කර 200 ක සෙරපිස් සාමූහික ජනාවාසය ආරම්භ කළේ 1973 ඔක්තෝබර මාසෙදියි. අද තරුණ තරුණියෝ 65 දෙනෙක් සමුපකාර සමිතියක් පිහිටුවාගෙන ඒ සමිතිය මගින් මේ විශාල වතු යාය පාලනය කරනව. ඒ අයට,



වතු සුපිරින්ටෙන්ඩන්ට්ල නෑ!!
කංකානම්ල නෑ!!
වතු හිමියෙක් නෑ!!
වතු කම්කරු පිරිසක් නෑ!!

එකම සහෝදර පිරිසක් හැටියට මේ වතු යායත්, එහි ඇති නිෂ්පාදන මාර්ගත් පාලනය කරන තරුණ සාමාජික සාමාජිකාවන්ගෙ එකම අරමුණ, සතුන් ඇති කිරිම, වෙනත් බෝග ද වැවීම ආදියෙන් වතුයාය තව තවත් දියුණු කරල එයින් ලබන පල ප්‍රයෝජනය රටේත්, තමන්ගේත් යහපත තකා පොදුවේ බෙද හැරීමට සැලැස්වීමයි.



වතුයාය සමූපකාරයට ලැබෙන කොට තිබුණ තත්ත්වය නෙවෙයි අද සෙරපිස් ගොවි පලේ දකින්නට තියෙන්නෙ. සමූපකාර සමිතිය රු. 10,000/- ක් විතර යොදවල ආරම්භ කළ කිරි පට්ටිය, ඌරු කොටුව, කුකුල් කොටුව ආදියෙන් දැන් ක්‍රම ක්‍රමයෙන් ආදායම වැඩි වෙනව. කෙහෙල් අක්කර 25 න් පමණක් පසුගිය අවුරුද්දෙ රු. 15,000/- ක ආදායමක් ලැබුණ බව සාමාජිකයො පැවසුව.

ගත වූ අවුරුදු දෙකක කාලය තුළ සමිතියේ අරමුදලේ සල්ලි රුපියල් දෙලක්ෂයක් විතර වතුයායෙ සංවර්ධන කටයුතුවලට යෙදවීමට පුළුවන් වෙලා තියනව. 1975 මැයි මාසය වන විට රු. 70,000/- ක පමණ ශුද්ධ ලාභයක් සෙරපිස් සාමූහික ජනාවාසයට ලැබී ඇති අතර එයින් කොටසක් ලාභාංශ හැටියට සාමාජිකයන් හට බෙදා දුන් බව ඔවුහු අපට කියා සිටිය. ගොවිපලේ විකිණීම සඳහා ඇති නිෂ්පාදන ද්‍රව්‍ය සාමාජිකයන්ට සහන මිළකට ලබාගන්නට පිළිවනි.

වතුයාය පාලනය කිරීමට සාමාජික පිරිස කාරක සභා ගණනාවකට බෙදී සිටිනව, ගිණුම්, විනය, අලෙවි, සංවර්ධන ආදී වශයෙන්. අවුරුද්දක සංවර්ධන සැළැස්ම පිළියෙල කර අනුමත කරන්නෙ සාමාජික සාමාජිකාවන් සියළු දෙනාම පාහේ රැස්වන මහා සභාවෙදියි.

ගොවිතැන් කටයුතු හා සත්ව පාලන කට යුතු කරගෙන යාමේදී සාමාජිකයින්ට ප්‍රදේශයේ ව්‍යාප්ති නිලධාරින්ගෙන් උපදෙස් ලැබෙන නිසා ඒ අතින් ඔවුනට කරදරයක් නැහැ. සාමාජිකයින්ගෙන් ඇතැම් අය ට්‍රැක්ටර් යන්ත්‍ර නඩත්තුව, කොම්පෝස්ට් පෝර සෑදීම ආදිය ගැනත් පුහුණුවක් ලබා තියෙනව. ඔවුන් ලැබූ පුහුණුව නිසා තමයි සාමාජිකයින්ට පුළුවන් වෙලා තියෙන්නෙ අක්කර 200 ක වතුයායක් එක බෝගයකට පමණක් වෙන් නොකර භූමිය වෙනත් නිෂ්පාදන මාර්ග වලටත් යොමු කරන්න. සෙරපිස් ගොවිපලේ සත්ව පාලන කටයුතු හුඟක් දුරට සාර්ථක බව කියන්න පුළුවනි.



දැනට ඇති වැව්ලි හා කර්මාන්ත වලින් පමණක් සෑහිමකට පත් නොවන මේ පිරිස මැටි විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය ආදී නව කර්මාන්ත කෙරෙහිත් සිත යොමු කර තියෙනව. මිරිදිය මසුන් ඇති කිරිමටත් මේ ගොවිපල සැලසුම් කර තියෙනව.

සාමාජිකයන්ගෙන් 22 දෙනෙක් විතර දැනට වත්තෙම පදිංචි වෙලා ඉන්නව. අසල් වැසි ගම්වාසීන් සමග සහයෝගයෙන් කට යුතු කරන සෙරපිස් ගොවිපලේ සාමාජික සාමාජිකාවෝ, තම ගොවිපලේ තියෙන වැවක් අළුත්වැඩියා කිරීමට අසල්වැසි ගම්වාසීන් 400 ක් පමණ දෙනාත් කැමුව ශ්‍රමදනයක් සංවිධානයක් කළ බව පැවසුව

මේ විදිහට උනන්දුවෙන් වැඩ කරන සෙරපිස් ගොවිපලේ සාමාජික සාමාජිකාෝ 1976 අවුරුද්දෙදි රුපියල් දෙලක්ෂයක ලාභයක් බලාපොරොත්තු වෙනව. ගොවිපල තරඹන කාට වුවත් කියන්න පුළුවනි, එවැනි ලාභයක් ලැබීම එතරම් අමාරු නොවන බව.